# මලී සහ බණ්ඩිරාල



කතෘ: සසිනි සෙයන්සා රත්නායක



CamScanner

# මලී සහ බණ්ඩිරාල

සසිනි සෙයන්සා රත්නායක

කතෘ

කතෘගේ වෙනත් කෘති

පුංචි රුවනි,අවුරුදු කුමාරයා,ආඩම්බර හා පැංචා

මහමායා බාලිකා විදුහල,මහනුවර

3 –C

2026.05.10

ISBN – IS49812



CamScanner

# පිදුම

මෙම කථාපොත ලිවීමට මා හට උපකාර කල මාගේ අම්මාටත් පවුලේ සියළු දෙනා හා මාගේ ගුරු මව්වරුන්ටත් ආදරයෙන් මෙම පොත පුදකර සිටිමි.



CamScanner



## පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සුදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස  දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි.  මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පුජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වු හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මුලික අරමුණයි.  මේ සඳහා නිර්මානකරණයෙන් දායක වු පාසල් දරුවන් මගපෙන්වු ගුරුභවතුන් ඇතුලු සැමට ස්තුතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය



CamScanner

මලීගේ පුංචි ගෙදර තිබුණේ ඈත ලස්සන ගමක.මලීගේ ගේ ඉස්සරහ හරිම සුන්දර වෙල් යායක් තමයි පිහිටලා තිබුණේ.වෙල අයිනට වෙන්න පුංචි දොළ පහරක් ගලා බසිනවා.දොළ පාරේ පුංචි පුංචි තිත්ත පැටව් පීනනවා බලාගෙන ඉන්න මලී හරිම කැමතියි.සමහර වෙලාවල පුංචි මලී දොළට බැහැලා තිත්ත පැටවු අල්ලනත් යනවා.



උදේට කන්ද උඩින් ඉර පායන කොට හරිම ලස්සනයි.මුළු වත්තෙම මල් පිපිලා හරිම සුවඳයි.මලීගේ මල් වත්තේ එක එක පාට මල් වර්ග වලින් පිරිලයි තිබුණේ.ලස්සන පාට පාට සමනල්ලු මලීගේ මල් වත්තේ පිරිලා,සමනල්ලු මල් පැණි බොනවා මලී හරි ආසාවෙන් බලා හිටියේ.





CamScanner

මලීගේ අත්තා තමයි බණ්ඩිරාළ,අම්මයි තාත්තයි වැඩට ගියාම මලී ඉන්නේ එයාගේ අත්තයි අත්තම්මායි එක්ක,මලී හරිම කැමතියි එයාලත් එක්ක ඉන්න.

අත්තම්මට කියලා රස රස කෑම හදව ගන්නත් මලී හරිම දක්ෂයි.අත්තම්මා හදන ලැවරිය,හැලප,අග්ගලා කන්න තමයි මලී කැමතිම,පිටිබැදලා පැණි පොල් දාලා

අත්තම්මා හදන අග්ගලා හරිම රසයි.අග්ගලා හදල ඉවර වෙනකල්ම මලී කුස්සියේ පුංචි බංකුවේ වාඩිවෙලා ඉන්නවා.

පළවෙනියටම හදන අග්ගලය ඉතින් යන්නේ පුංචි මලීගේ කටට.ඊට පස්සේ අත්තම්මා අග්ගලා ටික සේරම බෝතලයකට දාලා වහලා තියෙනවා.හවස තේ බොන කොට අත්තම්මා හැමෝටම අග්ගලා දෙනවා.



හැමදාම උදේට මලී අත්තත් එක්ක ඇවිදින්න යන්න තමයි හරිම කැමති.අත්තා උදෙන්ම වෙලට යන්නේ උදැල්ල කරේ තියාගෙන.මලී අත්තත් එක්ක වෙලට යන්නේ පුංචි බාල්දියක් අරගෙන.අත්තා කුඹුරු වැඩ කරන අතරේ මලී බාල්දියත් අරගෙන ඇළට බහිනවා.ඊට පස්සේ මලීගේ වැඩේ ඇළේ ඉන්න තිත්ත පැටව් අල්ලන එක.මලී අත්ත එක්ක ගෙදර යන්නේ තිත්ත පැටව් ගොඩක් බාල්දියට පුරවාගෙන.පාරෙදි හමුවෙන නැන්දලා මාමලා අත්තම්මලා,අත්තලා හැමෝම අත්තට කථා කලේ වෙද මාමා කියලා.






CamScanner

බණ්ඩිරාල අත්තා පුවක් කන්න හරිම රුසියා.දවසක් මලී අත්තගේ පුවක් තට්ටුවේ බුලත් කොළටික අයින් කරලා ගම්මිරිස් කොළ තිබ්බා.

ඔන්න ඉතින් දැන් මලී බලාගෙන ඉන්නේ සීයා බුලත් කන විදිහ.අත්තා වෙනදා වගේම තට්ටුව ළගට අරගෙන බුලත් පුවක් කටට දාගත්තා.





CamScanner

ඔන්න ඉතින් එතකොට තමයි අත්තට තේරුණේ, අත්තට හොඳටම හිනා ගියා.අපේ මලීගේ වැඩ කියලා අත්තම්මාත් හිනා වුණා.

තවත් දවසක් අත්තා නිදාගෙන ඉන්නකොට අත්තගෙ ඇග උඩට පූසාව දැම්මා.අත්තට එදානම් හොඳටම තරහා ගියා.



ඔන්න ඉතින් එදා නම් මලී ගොඩක් දුකෙන් හිටියේ, මලී ඉස්කෝලේ නිවාඩු ඉවරවෙලා ලොකු අම්මලාගෙ ගෙදර යන දවස, අත්ත මලීටයි ලොකු අම්මටයි ගොඩක් කැවිලි ජාති හදලා දුන්නා.මලී ආපහු යනවා අත්තා බලාගෙන හිටියේ හරිම දුකෙන්.....

වෙල්යාය පහුකරගෙන යනකොට මලීටත් ගොඩක් දුක හිතුනා.මන් ආයෙත් අත්තා බලන්න නිවාඩුවට එන්නම්.බණ්ඩිරාළ අත්තාගේ මූහුණ සිනහවකින් පිරීගියා.

# නිමි.



CamScanner

# පසුවදන

අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වු වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නුතන පාසල නුතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් **"හේමමාලා උපහාර"** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබළ ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැකවීම ද මෙහි මුලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තුති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
( ව්‍යාපෘති නිර්මාතෘ)



CamScanner